## ව්‍යාපාර නාමයක් අවලංගු කිරීම සඳහා වූ උපදෙස්

ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත සඳහන් උපදෙස් හොඳින් අධ්‍යනය කරන්න.

### ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. මෙම ප්‍රකාශය මුල් ලියාපදිංචි කිරීමේ සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතුය.
2. තනි පුද්ගල ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අයිතිකරු හෝ ඔහු මියගොස් ඇත්නම් ඔහුගේ නියෝජිතයෙකු වශයෙන් මෙම දැන්වීම අත්සන් තැබිය යුතුය.
3. හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නම් සියලුම හවුල්කරුවන් විසින් හෝ හවුල්කරුවෙකු මියගොස් ඇත්නම් අනෙකුත් හවුල්කරුවන් සමඟ මිය ගිය හවුල්කරුගේ නියෝජිතයෙකු විසින් හෝ මෙම දැන්වීම අත්සන් තැබිය යුතුය.
4. වෙළඳ කටයුතු නතර කර තුන් මාසයක් ඇතුළත දැනුම් දිය යුතුය.
5. හවුල් ව්‍යාපාරයක් වන කල්හි, මෙම ඉල්ලුම්පත්‍රය මඟින් ප්‍රකාශිත තොරතුරු ව්‍යාපාර හිමිකරුවන් විසින් වෙන වෙනම දිවුරුම් සහතිකය , ප්‍රතිඥා ප්‍රකාශය මඟින් සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

### ව්‍යාපාර නාමයක් අවලංගු කිරීමේ දී ලබා ගත යුතු ලියවිලි

I. බීඑන්ආර් - 06 ආකෘති පත්‍රය
II. අවසන් වරට නිකුත් කරන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
III. අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතෙහි හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි හෝ වලංගු රියදුරු බලපත්‍රයෙහි සත්‍ය පිටපත
IV. ව්‍යාපාරය නතර කර ඇති බවට ග්‍රාම නිලධාරි වාර්තාව (මෙය ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.)
V. හවුල් ව්‍යාපාරයක් නම්, ඉල්ලුම්පත්‍රය මගින් ප්‍රකාශිත තොරතුරු සනාථ කිරීම සඳහා සියලුම හවුල්කරුවන් විසින් වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන දිවුරුම් සහතිකය, ප්‍රතිඥා ප්‍රකාශය
VI. රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවිය හැකි වෙනත් ලියවිලි